(02) Extra

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

5938

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 11 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01යි.

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.
- ❖ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් පිළිපදින්න.
- ❖ සියලු ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- ❖ සෑම ප්‍රශ්නයකට ම ලකුණු එක බැගින් මුළු ලකුණු 40කි.

- අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

(01) සජීවී ද්‍රව්‍යවලින් තොරව ඒකරාශී වූ ඛනිජ සමූහය ........................................................ වේ.
(පස, පාෂාණ, යපස්)

(02) නියත රසායනික සංයුතියක් ඇති ස්වාභාවික අකෛන්ද්‍රිය ද්‍රව්‍ය .................................... ලෙස හැඳින්වේ.
(යපස් , ගල්අඟුරු , ඛනිජ)

(03) ගෝලීය ජල ව්‍යාප්තියෙන් මිරිදිය ජලය ඇත්තේ ................................................ ප්‍රමාණයකි.
(2.8% , 2.15% , 97.2%)

(04) වර්ෂ 2050 සඳහා ප්‍රක්ෂේපිත ජන සංඛ්‍යාව අනුව රටවල් පෙළ ගැස්වූ විට ............................................ ප්‍රථම ස්ථානය ගනී.
(චීනය , ඇ.එ.ජනපදය, ඉන්දියාව)

(05) පෘථිවි ......................................... සියැල් හා සීමා (සිමැග්) යන ස්ථර දෙකකින් සමන්විත වේ.
(හරය / කබොල / ප්‍රාවරණය)

(06) ස්වාභාවික වනාන්තර ගණයට අයත් වනාන්තරවලින් ශ්‍රී ලංකාවේ අද ඉතිරිව ඇත්තේ ................................ පමණ ය.
(35% , 22% , 32%)

(07) ශ්‍රී ලංකාවේ නිරිත දිග ප්‍රදේශයේ ............................................ ජලවහන රටාවක් දක්නට ඇත.
(අරීය , ජාලාකාර, ශාඛීය)

(08) ශ්‍රී ලංකාව වටා ................................................... ක් පමණ මුහුදු වෙරළ තීරයක් අප සතු වේ.
(1770km , 1070km , 7017km)

(09) ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සේවය ආරම්භ කරනු ලැබුවේ ............................................ දී ය.
(1832 , 1862 , 1860)

(10) පිලිපීනයේ ඇති සුප්‍රසිද්ධ ගිනි කන්ද ........................................................... ය.
( පිනැටුබෝ , විසුවියස් , හෙල්කා)

- අංක 11 සිට 20 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.

(11) වර්තමානයේ ඛනිජ සම්පත් අධික ලෙස ප්‍රයෝජනයට ගැනීමට බලපාන හේතු වන්නේ ජනසංඛ්‍යාවේ වැඩිවීම හා ඔවුන්ගේ අවශ්‍යතා වැඩිවීමත් ය. (නි / වැ)

(12) ඉහළ යැපෙන්නන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තම අත්දැකීම් අනුව සංවර්ධනයට දායක වේ. (නි / වැ)

(13) නිවර්තන වර්ෂා වනාන්තරවල පයින්, ෆර්, ලාච්, ස්ප්‍රෑස් වැනි ශාක වැඩේ. (නි / වැ)

(14) ශ්‍රී ලංකාවේ පාෂාණවලින් 90% ප්‍රාග්කේම්බ්‍රීය හෙවත් ආකිය යුගයට අයත් වේ. (නි / වැ)

(15) මහවැලි වැනි සංවර්ධන ව්‍යාපාර ආශ්‍රිතව රේඛීය ජනාවාස බිහිව ඇත. (නි / වැ)

(16) ඛනිජ තෙල් මිල ඉහළ යෑම නිසා ඛනිජ තෙල් ආනයනය කරන සංවර්ධිත රටවල වෙළෙඳ ශේෂය මෑතක සිට සෘණ අගයක් ගනී. (නි / වැ)

(17) ශ්‍රී ලංකාවේ ක්‍රමානුකූලව මහා මාර්ග නිර්මාණය 1820 දී බ්‍රිතාන්‍ය ජාතිකයන් ආරම්භ කළහ. (නි / වැ)

(18) සුනාමි තත්ත්වයන් ඇති වන්නේ මහාද්වීප අභ්‍යන්තරයේ ප්‍රබල භූමිකම්පා ඇතිවූ විට ය. (නි / වැ)

(19) ගල් අඟුරු හා ජිප්සම් ආග්නේය පාෂාණ වර්ගයට අයත් වේ. (නි / වැ)

(20) ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය තුළ විශාල පිපිරීමක් ඇතිවී නව භූතල මායිමක් නිර්මාණය වී ඇත. (නි / වැ)

- අංක 21 සිට 30 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

(21) ආර්ජන්ටිනාවේ පිහිටි සෞම්‍ය කලාපීය තෘණභූමි.................................................. නම් වේ.

(22) 1 : 50 000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන පරිමාණයට අනුව භූමියේ සැබෑ දුර කිලෝමීටර 1ක් සිතියමේ ........................ දැක්වේ.

(23) කිරල, වල් අනෝදා, දියකඳුරු, පුංකන්ඩ, ගිංපොල් ආදී ශාක ...................................... ශාඛ පද්ධතිය තුළ බහුලව දක්නට ඇත.

(24) රටක ජන සංඛ්‍යාව වයස් හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව බෙදා දක්වන සටහන ජන සංඛ්‍යා .................................. යනුවෙන් හැඳින්වේ.

(25) නිර්මාණය වී ඇති ආකාරය අනුව හිමාලය, ඇල්ප්ස් වැනි කඳු අයත් වන්නේ ........................................ ගණයට ය.

(26) පැසිෆික් හා අත්ලාන්තික් සාගරය සම්බන්ධ කරන ඇල මාර්ගය ................................................... නම් වේ.

(27) ....................................................... ගුවන් තොටුපළ ශ්‍රී ලංකාවේ දෙවන වරට ඉදි වූ ජාත්‍යන්තර ගුවන් තොටුපළ වේ.

(28) මුහුද ආපස්සට ගමන් කිරීම ......................................... අනතුරු දැනගත හැකි ක්‍රමයකි.

(29) ශ්‍රී ලංකාව අවට නව තැටි මායිමක් නිර්මාණය වීම නිසා අනාගතයේ දී .......................................... වැඩිවීමේ අවදානමක් ඇත.

(30) ශ්‍රී ලංකාවේ 1:50 000 සිතියම්වල භූවිෂමතා ලක්ෂණ සමෝච්ච රේඛා මගින් දක්වා කඳු මුදුන්වල උස ...................... ස්ථාන ලෙස දක්වා ඇත.

- ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරි මත දක්වන්න.

(31) ඊයම් ඛනිජ වර්ගය බහුලව පිහිටි රටක් නොවන්නේ,

(1) චීනය (2) ජර්මනිය

(3) ඕස්ට්‍රේලියාව (4) එක්සත් රාජධානිය (................)

(32) ස්වභාවික සම්පත් ප්‍රධාන වශයෙන් බෙදී යන කොටස් තුන මේ අතරින් කවරක් ද?

(1) ගස්වැල්, භූමිය, ක්ෂය වන සම්පත්

(2) අලෝහ, ජලය, යළි භාවිතයට ගත හැකි සම්පත්

(3) වනජීවීන් , සාගර ප්‍රවාහ, ක්ෂය වන සම්පත්

(4) ක්ෂය වන සම්පත්, ක්ෂය නොවන සම්පත්, යළි භාවිතයට ගත හැකි සම්පත් (................)

(33) ලෝකයේ සංවර්ධිත රටවල් අතර පිහිටුවාගත් වෙළෙඳ සංවිධානය නමින් හැඳින්වේ.

(1) සප්තා (2) ඔපෙක්

(3) යුරෝපා පොදු වෙළඳ හවුල (4) නේටෝ (................)

(34) ලෝකයේ යකඩ හා වානේ කර්මාන්ත ව්‍යාප්ත වී ඇති පිට්ස්බර්ග් කාර්මික කලාපය අයත් වන මහද්වීපය වන්නේ

(1) අප්‍රිකාව (2) යුරෝපය

(3) ආසියාව (4) උතුරු ඇමරිකාව (................)

(35) "ටොනාඩෝ" තත්ත්වයේ කාලගුණික සංසිද්ධියක් නොවන්නේ මින් කුමක් ද?

මෙය විනාඩි 10 - 15 පමණ වේලාවක කුඩා ප්‍රදේශයක ඇතිවේ.

විනාශකාරී ලෙස පොළව මත ඇති විවිධ ද්‍රව්‍ය ඉහළට ඇද ගනියි.

පැයට කිලෝමීටර 200 වැඩි ප්‍රබල වේගයක් උපදවා ගත හැකි ය.

ලෝකයේ තැටි මායිම් ආශ්‍රිතව බහුලව සිදු වේ.

(1) A (2) B (3) C (4) D (................)

(36) ✦ විශාල ගොවිපලවල වගා කිරීම

✦ වාණිජ පදනමින් වගා කිරීම

✦ ප්‍රාග්ධනය බහුල වශයෙන් භාවිතයට ගැනීම

✦ යන්ත්‍ර සූත්‍ර භාවිතය වැඩිවීම

ඉහත සඳහන් ලක්ෂණ දක්නට ඇත්තේ කවර කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ගයේ ද?

(1) සියුම් පාරිභෝගික කෘෂිකර්මය (2) මධ්‍යධරණී කෘෂිකර්මය

(3) විස්තෘත වාණිජ කෘෂිකර්මය (4) වතු කෘෂිකර්මය (................)

(37) ප්‍රපාතාකාරව විහිදෙන බෑවුමක් දැක්වීමේ දී සමෝච්ච රේඛා ඉතාමත් ළංව පිහිටයි. මෙවැනි බෑවුම් හඳුන්වන්නේ,

(1) මෙහොර බෑවුම (2) සමමිතික බෑවුම

(3) උත්තල බෑවුම (4) අවතල බෑවුම (................)